JMC vLearning
"your virtual learning partner"

# ශේෂ පිරික්සුම

රුක්මල් විජේකෝන්

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

ශේෂ පිරිකසුම යනු යම් නිශ්චිත අවස්ථාවක ලෙජර ගිණුම් සියල්ලේම අවසාන ශේෂ දක්වමින් පිළියෙල කරනු ලබන ශේෂ ලැයිස්තුවකි. මෙය ගිණුමක් නොවේ. ශේෂ ලැයිස්තුවකි. ලෙජර් ගිණුම් වලට අදාළ හර ශේෂයන් හා බැර ශේෂයන් දැක්වීමට වෙනම තීරු 2 ක් හා ගිණුමේ නම ලිවීමට විස්තර තීරුවක් ද සහිතව මෙය පිළියෙල කරන අතර අදාළ ගිණුම ඇත්තේ ලෙජරයේ කවර පිටුවේ ද යන්න දැක්වීමට ''ලෙජර පිටුව'' නමින් තීරුවක් ද ඇත. සරල ආකෘතියක් පහත දැක්වේ.

**ශේෂ පිරිකසුම**

| දිනය | විස්තරය | ලෙ. පි. | හර | බැර |
|---|---|---|---|---|
| | වත්කම් | | xxx | |
| | වියදම් | | xxx | |
| | වගකීම් | | | xxx |
| | ආදායම් | | | xxx |
| | හිමිකම් | | | xxx |
| | | | xxx | xxx |

ලෙජර් ගිණුම් පිළියෙල කරනුයේ ද්විත්ව සටහන් මූලධර්මය අනුව බැවින් ශේෂ පිරික්සුමක හර තීරුවේ එකතුව බැර තීරුවේ එකතුවට සමාන විය යුතුය. එසේ නොවුනහොත් ගිණුම් තැබීමේ වරදක් හෝ ශේෂ පිරික්සුම උපුටා ගැනීමේ දෝෂයක් ඇති බව හෙළි කරයි.

## ශේෂ පිරික්සුමක අභිමතාර්ථ

(The Objectives of the Trial Balance)

1. ගිණුම්වල අංක ගණිතමය නිවැරදිතාවය තහවුරු කර ගැනීම.
2. අවසාන ගිණුම් සකස් කිරීමට හැකිවන පරිදි සාරාංශයක් පිළියෙල කිරීම.

ශේෂ පිරික්සුම සමාන විය යුතුය. සමාන නොවේනම් එයින් පැහැදිලි වන්නේ ලෙජර් ගිණුම්වල දෝෂයක් ඇති බවයි. එහෙත් ශේෂ පිරික්සුමක් සමාන වූ පමණින්ම ලෙජරයේ ඇතුළත් සටහන් 100% නිවැරදි යැයි නිගමනය කළ නොහැක. මෙයින් ගම්‍ය වන්නේ ලෙජරයේ වැරදි තිබුණ ද ශේෂ පිරික්සුම ඇතැම්විට එකඟ විය හැකි බවයි. එයට හේතුව ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන දෝෂ තිබිය හැක.

### උදාහරණ - 12

මහේෂ් 100,000/= ප්‍රාග්ධනය ලෙස යොදා 2017.01.01 දින ව්‍යාපාරයක් ආරම්භ කලා.

| ජන: 1 | බඩු අත්පිට ගත්තා. | 15,000/= |
|---|---|---|
| ජන: 2 | යන්ත්‍රයක් ගත්තා | 7,000/= |
| ජන: 3 | ගෙවල් කුලී ගෙව්වා | 700/= |
| ජන: 4 | **ණයට ගැණුම්** | |
| | සිල්වාගෙන් | 15,000/= |
| | පෙරේරාගෙන් | 7,000/= |
| | පාලගෙන් | 8,000/= |
| ජන: 6 | විදුලිය ගෙව්වා | 500/= |
| ජන: 7 | රක්‍ෂණ | 300/= |
| ජන: 8 | අත්පිට විකුණුම් | 2,000/= |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| ජන: 1.9 | **ණයට විකුණුම්** | |
| | අනුරට | 2,000/= |
| | සමන්ට | 3,000/= |
| | රංජිත්ට | 2,000/= |
| ජන: 10 | **ආපසු යැවුම්** | |
| | සිල්වාට | 1,500/= |
| | පෙරේරාට | 1,000/= |
| ජන: 11 | ගෙවල් කුලී ගෙව්වා | 2,000/= |
| ජන: 12 | **ආපසු එවුම්** | |
| | අනුර | 500/= |
| | සමන් | 800/= |
| ජන: 13 | ලීබඩු ගත්තා | 3,000/= |
| ජන: 14 | අත්පිට විකුණුම් | 1,000/= |

පහත දෑ පිලියෙළ කරන්නග

1. උපයෝගී පොත් පිළියෙල කරන්න.
2. ලෙජරයේ ගිණුම් පිළියෙල කරන්න.
3. ශේෂ පිරිකසුම පිළියෙල කරන්න.

## උදාහරණ - 13

සතිස්ගේ ව්‍යාපාරයේ 2017/12/31 දිනට පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| ඉඩම් ගොඩනැගිලි | 150,000 |
|---|---|
| **යන්ත්‍ර** | 60,000 |
| **ලීබඩු** | 20,000 |
| **ණයගැතියෝ** | 5,000 |
| **බඩුතොගය** | 3.000 |
| **ණයහිමියෝ** | 4,000 |
| **උපචිත වියදම්** | 2,000 |
| **මුදල්** | 3,000 |

| ජන: 1 | අතිරේක ප්‍රාග්ධනය යෙදුවා | 25,000/= |
|---|---|---|
| ජන: 2 | අත්පිට ගැණුම් | 2,000/= |
| ජන: 3 | **ණයට ගැණුම්** | |
| | ප්‍රියන්තගෙන් | 7,000/= |
| | ජයන්තගෙන් | 3,000/= |
| | සුගත්ගෙන් | 4,000/= |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| **ජන: 4** | ගෙවල් කුලී ගෙව්වා | 1,000/= |
| **ජන: 5** | **ආපසු යැවුම්** | |
| | ප්‍රියන්තට | 500/= |
| | ජයන්තට | 700/= |
| | සුගත්ට | 400/= |
| **ජන: 6** | අත්පිට විකුණුම් | 1,000/= |
| **ජන: 7** | රක්ෂණ | 500/= |
| **ජන: 8** | ණයට විකුණුම් | |
| | වසන්තට | 1,000/= |
| | සුසන්තට | 1,500/= |
| **ජන: 9** | විදුලි ගෙව්වා | 1,200/= |

පහත දෑ පිලියෙළ කරන්න.

1) උපයෝගි පොත

2) ලෙජරයේ ගිණුම්

3) ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

## උදාහරණ - 14

සංජය අමරසිංහ විසින් 2017 ජනවාරි 01 දින ව්‍යාපාරයක් අරඹනු ලැබීය. ජනවාරි මාසය තුළ සිදුවු ගණුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| ජන: 01 | රු: 500,000 ප්‍රාග්ධනය ලෙස යොදා බැංකු ගිණුමක් විවෘත කළහ. |
| ජන: 03 | රු: 50,000 චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කොට මුදල් ලබා ගත්හ. |
| ජන: 05 | අනුර දේපල වෙළඳාම් සමාගමෙන් රු: 350,000 කට ඉඩම් හා ගොඩනැගිලි ගනු ලැබීය. |
| ජන: 06 | අනුර දේපල වෙළඳාම් සමාගමට රු: 75,000 චෙක්පතින් ගෙව්වා |
| ජන: 08 | රු: 25,000 ක භාණ්ඩ මිල දී ගෙන ඒ සඳහා චෙක්පතක් නිකුත් කළහ. |
| ජන: 10 | අත්පිට මුදලට විකුණුම් 16,000 |
| ජන: 11 | ණයට භාණ්ඩ ගත්තා. |

**හරිස්චන්ද්‍ර සමාගමෙන්,**

පැකට් එකක් රු: 20/= බැගින් පපඩම් පැකට් 100 බෝතලයක් රු: 40/= බැගින් විනාකිරි බෝතල් 20 (අඩුකල වෙළඳ වට්ටම 10%)

**උපාලි සමාගමෙන්,**

පැකට් එකක් රු: 50/= බැගින් චොක්ලට් පැකට් 25, කැටයක් රු: 4/= බැගින් සබන් කැට 200 ජන: 13 ණයට විකුණුම්.

**බන්දුලට,**

පොතක් රු: 40/= බැගින් ගිණුම් පොත් 5, කමිසයක් රු: 400 බැගින් කමිස 3 යි. (අඩුකල වෙළඳ වට්ටම 20%).


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**දර්ශනට,**

පැකට් 1 ක් රුː 80 බැගින් බිස්කට් පැකට් 5 යි. බෝතලයක් රුː 60/= බැගින් කෝඩියල් බෝතල් 10 යි.

ජනː 15 වරිපනම් සහ බදු කුලී ගෙව්වා රුː 600/= යි.

ජනː 16 අත්පිට විකුණුම් 30,000

ජනː 18 බැංකුවේ මුදල් තැන්පත් කළා රුː 15,000

ජනː 20 විදුලිය වියදම් චෙක්පතින් ගෙව්වා රුː 1,200

ජනː 22 බන්දුලගේ ණය මුදලට සම්පූර්ණයෙන් පියවීම සඳහා ප්‍රමාණවත් මුදලක් 10% වට්ටමක් යටතේ ලැබුණා.

ජනː 24 දර්ශනගේ ණයවලින් රුː 500 ණය පියවීම සඳහා 10% වට්ටමින් අඩු කළ පසු ලැබිය යුතු මුදල සඳහා චෙක්පතක් ලැබුණා.

ජනː 25 දර්ශනගේ චෙක්පත බැංකු ගත කළා.

ජනː 27 උපාලි සමාගමට ගෙවිය යුතු සම්පූර්ණ ණය මුදල 5% වට්ටමක් යටතේ පියවීමට ප්‍රමාණවත් මුදලක් එදින ගෙව්වා.

ජනː 28 සේවක වේතන ගෙව්වා රුː 4,000

ජනː 29 අත්පිට විකුණුම් රුː 14,000 අත්පිට ගැණුම් 3,000

ජනː 30 හරිස්චන්ද්‍ර සමාගමට ගෙවිය යුතු මුදලින් රුː 5,000 මුදලින් පියවීමට ප්‍රමාණවත් වු මුදලක් 10% වට්ටමක් යටතේ මුදලින් ගෙව්වා.
වයාපාරයේ ප්‍රයෝජනය සඳහා ජයසිංහ ලී බඩු ආයතනයෙහි පුටුවක් රුː 500/= බැගින් පුටු 5 ක්ද, රුː 1,500/= බැගින් වු කාර්යාල මේස 2 ක්ද ණයට ගත්තා.

ජනː 31 බැංකුව ජංගම ගිණුමෙන් රුː 600/= ක ගාස්තුවක් අය කල බව දැනුම් දුන්නා.

ඔබ විසින් අවශ්‍ය සියලුම උපයෝගී පොත් සහ ලෙජර් ගිණුම් පිළියෙල කොට ජනවාරි 31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කර දක්වන්න

## උදාහරණ -15

මහානාම විසින් 2017/09/01 දින වෙළඳ ව්‍යාපාරයක් (සිල්ලර) ඇරඹීය. පළමු මාසය තුළ සිදුවූ ගණුදෙනු පහත පරිදි වේ.

2014 සැප්. 01 ප්‍රාග්ධනය වශයෙන් රු. 100,000/- යෙදවීම.

02 රු. 500,000/- බැංකුවේ තැන්පත් කර ජංගම ගිණුමක් විවෘත කරන ලදී.

03 රුː 100,000/- චෙක් පතක් දී ව්‍යාපාරයට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී.

04 සිල්ලර බඩු අත්පිට ගැණුම් රුː 100,000/- කි. චෙක්පතකින් ගෙවීම් කරන ලදී.

05 සංජීවට ණයට විකුණුම්

සහල් 1 kg ක් රුː 60/- බැගින් 10kg.

සීනි 1 kg ක් රු. 64/- බැගින් 5kg

පිටි 1 kg ක් රු. 60/- බැගින් 5 kg


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

මිරිස් 10 kg ක් රු. 240/- බැගින් 1 kg

06 සේවක වැටුප් ගෙවුවා රුː 20,000/-

07 ගොඩනැගිලි කුලී ගෙවුවා රුː 50,000/-

08 ණයට ගැණුම් තරංගගෙන්

සහල් 1 kg ක් රු. 60 බැගින් 50 kg ගෝනි 2 ක්

සීනි 1 kg ක් රු. 60 බැගින් 60 kg

පිටි 1 kg ක් රු. 60 බැගින් කිලෝ 50 ගෝනි 2

ලද වෙළඳ වට්ටම 5%

09 සංජීව විසින් හරවා එවුම්,

මිරිස් 5kg ක් (බොල් මිරිස් තිබීම)

10 අත්පිට විකුණුම් රු. 135,000/- කිග ඉන් රු. 100ල000/- ලැබුනේ චෙක්පතකිනි.

11 තරංගට හරවා යැවුම්

සීනි 20kg ක්. (ජලය මිශ්‍රවී තිබීම)

12 රුː 7,500/- පියවීමට තරංගට රු. 6,000/- ක චෙක්පතක් නිකුත් කළා.

18 රුː 5,000/- සුළු මුදල් භාරකරුට ලබා දුන්නා.

20 සංජීවගෙන් ලැබිය යුතු මුදල 10% ක වට්ටමකට යටත්ව චෙක්පතකින් ලැබුනා.

22 ලද සියළු චෙක්පත් බැංකු ගත කළා.

25 දුරකථන ගාස්තු රු. 9,000/- ගෙවීමට චෙක්පතක් නිකුත් කළා.

29 සුළු මුදල් භාරකරු පහත වියදම් සඳහා අදාළ ලියවිලි ප්‍රධාන මුදල් භාරකරුට ඉදිරිපත් කළා.

ගමන් වියදම් රු. 2,500/-

තැපැල් වියදම් රු. 500/-

සංග්‍රහ වියදම් රු. 500/-

විවිධ වියදම් රු. 1,000/-

30 සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කළාග

පහත දෑ පිලියෙළ කරන්න.

1) සියලුම මූලික පොත්

2) ගණුදෙනු ලෙජරයට පිටපත් කරන්න.

3) ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd